| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No. | අධිසේ.කොස/ලිපිකරු III ශ්‍රේණිය<br>(විවෘත)බඟැ- 2026 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2026.11.09 |
|---|---|---|---|---|

සියළුම විභාග අපේක්ෂකයින් වෙත,

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සේවයේ අධිකරණ ලිපිකරු III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගයේ සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා කඩඉම් ලකුණු නිකුත් කිරීම - 2026**

උක්ත සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ කඩඉම් ලකුණු මට්ටම 159 ක් (සෑම විෂයයකට ලකුණු 40 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් ) ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත. අදාල ලකුණු ලේඛනය පහත වෙබ් අඩවියට පිවිසීමෙන් ලබගෙන හැක.

Link :
https://docs.google.com/spreadsheets/d/1wbE24m2ML1aLh18JB4GLZY4bwhXuBU9F/edit?usp=drive_link&ouid=114917825337101956501&rtpof=true&sd=true

02. ලකුණු 159 ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගෙන ඇති අයදුම්කරුවන් ( ප්‍රතිඵල ලේඛනයේ අනු අංක 01 සිට 971 දක්වා) 2026.11.22 දින පෙ.ව.09.00 ට **කොළඹ මහාධිකරණ පරිශ්‍රයේදී** පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

03. ඒ සඳහා සහභාගිවීමට සුදුසුකම් ලත් අයදුම්කරුවන් පහත දැක්වෙන ලේඛනවල මුල් පිටපත් සමඟ ඒවායේ සහතික කර ගන්නා ලද ඡායාස්ථික පිටපත් පහත සඳහන් අනුපිළිවෙලට සකස්කර රැගෙන ආ යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. ජාතික හැඳුනුම්පත
iii. ග්‍රාම සේවා සහතිකය
iv. මෑතකදී ලබාගත් චරිත සහතික 01 ක්
v. අධ්‍යාපන සහතික හා වෙනත් සහතික (අ.පො. සාමාන්‍ය පෙළ, අ.පො.ස.උසස් පෙළ සහතිකය, උපාධි සහ වෙනත් අධ්‍යාපන පිළිබඳ සහතික, ජාත්‍යන්තර භාෂා,ගිණුම්, පරිගණක හා වෙනත් හදාරා ඇති පාඨමාලා සම්බන්ධයෙන්)
vi. දැනට රාජ්‍ය සේවයේ නියුතු නම් සේවා සහතිකය ( වර්තමාන සේවා ස්ථානයේ ආයතන ප්‍රධානියාගෙන් ලබා ගත් )

03. මෙ සම්බන්ධයෙන් ගමන් වියදම් ගෙවනු නොලැබේ.

04. **මෙම දැන්වීම මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා කරන කැඳවීම් ලිපිය වන අතර, වෙනත් කැඳවීමේ ලිපියක් නිකුත් කරනු නොලැබේ.**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව


තැ.පෙ. 573, අළුත් කඩේ, කොළඹ 12. த.பெ.இல. 573, புதுக்கடை, கொழும்பு 12. P.O. Box 573, Hulftsdorp, Colombo 12.
ලේකම් / செயலாளர் / Secretary (+94) 11 2321104 කාර්යාලය / அலுவலகம் / Office (+94) 11 2433119 / 2451159 (+94) 11 2446111 jscinformaion@jsc.gov.lk www.jsc.gov.lk